PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

ලලිත් යූ ගමගේ මහතා, 2024.07.12
ගරු ආණ්ඩුකාර,
මධ්‍යම පළාත.

ගරු ආණ්ඩුකාරතුමනි,

**පළාත් පාලන අපේක්ෂකයන් ආණ්ඩුකාරවරයාගේ නියෝජිතයින් ලෙස පත්කිරීම**

මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන සඳහා ආණ්ඩුකාරවරයාගේ නියෝජිතයින් ලෙස මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්ව සිටින අපේක්ෂකයන් පත්කරමින් ඇති බව අප වෙත වාර්තාවී ඇත. එමෙන්ම එසේ පත්වීම් ලද සමහර නියෝජිතයින් තමන් කාර්යාලයීය කටයුතු සිදුකල පළාත් පාලන ආයතන වෙත ගොස් ඒවායේ සභාපතිවරු වශයෙන් වැඩ බාරගත් බවට සමාජ මාධ්‍යයේ ඡායාරූප පවා පලකරමින් සටහන් තබා ඇත.

මෙම පත්කිරීම් හා පත්වීම් ලද පිරිස පළාත් පාලන ආයතන සතු වාහන සහ කාර්යාල භාවිත කිරීම සංවර්ධන කටයුතු සඳහා මැදිහත්වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබී ඇති බලතල හරහා නිකුත් කල චක්‍රලේඛ බරපතල ලෙස උල්ලංඝනය කරන්නකි. එමෙන්ම කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව මැතිවරණ කොමිෂන් සභාවේ නියෝග හෝ උපමාණ නොසලකා හැර ඇති බවට අධිකරණය ඉදිරියේ ඔප්පු වුවහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (උ) ව්‍යවස්ථාව අනුව දඬුවම් හිමිවිය හැකිය.

මෙම තත්ත්වය නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහාද බාධාකාරී වන අතර මෙමගින් රාජ්‍ය නිලධාරීන්ට නීතියට එරෙහිව යාම සඳහා සිදුකරනු ලබන පෙළඹවීමක් ලෙසද පෙනීයයි.

එබැවින් අප ඔබතුමාගෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටින්නේ මෙම නීති විරෝධී පත්වීම් කඩිනමින් අවලංගු කර නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා සහයෝගය ලබාදෙන ලෙසය.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

පිටපත්
මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුලු සියලු කොමසාරිස්වරුන්
මාධ්‍ය ආයතන හා උනන්දුවක් දක්වන සෙසු පාර්ශව

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com